# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# අන්තර්ජාතික ථේරවාද ධර්මායතනය (සංස්ථාගත කිරීමේ)

**අන්තර්ජාතික ථේරවාද ධර්මායතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

පොළොන්නරුව දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා විසින් 2023 පෙබරවාරි මස 10 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2023 ජනවාරි මස 17 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

**[166 වන පනත් කෙටුම්පත]**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිල : රු. 25.00** **තැපැල් ගාස්තුව : රු. 50.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# අන්තර්ජාතික ථේරවාද ධර්මායතනය (සංස්ථාගත කිරීමේ)

## අන්තර්ජාතික ථේරවාද ධර්මායතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

පූර්විකාව

"අන්තර්ජාතික ථේරවාද ධර්මායතනය" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන, ආයතනයක් එකී ආයතනයේ සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුව, එකී ආයතනයට සම්බන්ධ සියලු කරුණු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද:

එකී ආයතනය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද, එම පරමාර්ථ සහ කාරණා මෙතෙක් කල් එකී භාරකාරත්වය විසින් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් ද, එකී ආයතනය සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද, ඒ ඉල්ලීම ඉටුකිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය

1. මේ පනත 2023 අංක  දරන අන්තර්ජාතික ථේරවාද ධර්මායතනය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

අන්තර්ජාතික ථේරවාද ධර්මායතනය සංස්ථාගත කිරීම

2. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසුව (මෙහි මින්මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) අන්තර්ජාතික ථේරවාද ධර්මායතනයේ දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් සහ මෙයින් පිහිටුවනු ලබන සංස්ථාවට සාමාජිකයන් වශයෙන් මින්මතු ඇතුළත් කරනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු "සංස්ථාපිත මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) අන්තර්ජාතික ථේරවාද ධර්මායතනය යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, ඊට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි ය. තව ද, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද, පූර්ණ බලය සහ අධිකාරය එකී සංස්ථාපිත මණ්ඩලයට තිබිය යුතු ය.

3. සංස්ථාපිත මණ්ඩලය විශේෂයෙන් ම ලාභ නොලබන සංවිධානයක් ලෙස ක්‍රියාත්මක වන අතර එය සමාජයේ සහ එහි සාමාජිකයන්ගේ ප්‍රයෝජනය සඳහා පමණක් ම වේ.

සංස්ථාපිත මණ්ඩලය ලාභ නොලබන සංවිධානයක් ලෙස ක්‍රියාත්මක කිරීම

4. (1) සංස්ථාපිත මණ්ඩලය පිහිටුවනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යැයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

සංස්ථාපිත මණ්ඩලයේ පොදු පරමාර්ථ

(අ) බෞද්ධ ඉගැන්වීම්වලට අනුව උත්තරීතර විමුක්තිය වන නිර්වාණය තනිව සාක්ෂාත් කිරීමට අවශ්‍ය ධර්ම විනය ඥානයෙන් සහ භාවනා පිළිබඳ ඥානයෙන් යුක්ත වූ ගිහි පැවිදි පිරිසක් බිහිකිරීම;

(ආ) බෞද්ධ ඉගැන්වීම්වලට අනුව උත්තරීතර විමුක්තිය වන නිර්වාණය සාක්ෂාත් කර ගැනීම සඳහා ගිහි පැවිදි දෙපාර්ශවයට මඟ පෙන්වීමට සමර්ථ වූ ගිහි පැවිදි පිරිසක් බිහිකිරීම;

(ඇ) ථේරවාද බෞද්ධ ඉගැන්වීම්වලට අනුව නිවැරදිව විනය කර්ම සිදුකිරීම මගින් ශාසනය අවිච්ඡින්නව පවත්වා ගෙන යාමට සමර්ථ වූ බෞද්ධ භික්ෂූන් වහන්සේලා බිහිකිරීම;

(ඈ) ථේරවාද ඉගැන්වීම්වලට අදාළ පොත්පත් පළකිරීම සහ පරිවර්ථනය කිරීම;

(ඉ) පවතින නීතිරීති සහ සංස්කෘතික පිළිගැනීම්වලට ගරුකරමින් දේශීය සහ විදේශීය වශයෙන් තථාගත ප්‍රවේදිත ධර්ම විනය ලොව පුරා ප්‍රචාරක කටයුතු සඳහා ධර්මදූතයන් පුහුණු කිරීම සහ යොමු කිරීම; සහ

(ඊ) ඉහත (අ) වගන්තියේ සඳහන් පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා මහා සභාව විසින් තීරණය කරන ලද වෙනත් සියලු ක්‍රියාකාරකම් සිදුකිරීම.

**5.** ආණ්ඩුවේ හෝ පළාත් සභාවක යම් අමාත්‍යාංශයක් හෝ දෙපාර්තමේන්තුවක් විසින් සමගාමීව පවත්වාගෙන යනු ලබන යම් කාර්යයක් සහ සංස්ථාවේ කාර්ය අතර කිසිදු ගැටුමක් නිර්මාණය නොවන ආකාරයෙන් සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කළ යුතු ය.

ආණ්ඩුවේ හෝ පළාත් සභාවක අමාත්‍යාංශයක හෝ දෙපාර්තමේන්තුවක කාර්ය සමඟ, සංස්ථාවේ කාර්ය, ගැටුම් සහගත නොවන බවට සංස්ථාපිත මණ්ඩලය සහතික විය යුතු බව

**6.** (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමනාකරණය සහ පරිපාලනය, මේ පනතේ 12 වන වගන්තිය යටතේ සාදනු ලබන සංස්ථාවේ රීති මගින් නිශ්චය කරනු ලැබිය හැකි ධුර දරන්නන් යම් සංඛ්‍යාවකින් සමන්විත (මෙහි මින්මතු "විධායක සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) විධායක සභාවක් විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමනාකරණය කිරීම

(2) (අ) මේ පනත ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී ධුර දරනු ලැබූ ධර්මායතනයේ සභාව, 12 වන වගන්තිය යටතේ සාදනු ලබන රීති මගින් විධිවිධාන සලස්වා ඇති ආකාරයට ප්‍රථම සභාව පත් කරනු ලබන හෝ තෝරා පත්කරනු ලබන තෙක් සංස්ථාපිත මණ්ඩලයේ, විධායක සභාව වශයෙන් ක්‍රියා කළ යුතු ය.

(ආ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට වසරක් ඇතුළත සංස්ථාවේ පළමු විධායක සභාව පත්කිරීම හෝ තෝරා පත්කර ගැනීම කළ යුතු ය.

(3) (අ) විධායක් සභාවේ ධුර දරන සෑම ධුර දරන්නකුම වර්ෂ හයක කාලයක් සඳහා පත්කර ගත යුතු හෝ තෝරාපත් කරගත යුතු අතර, එම වර්ෂ හයක කාලසීමාව ඉකුත් වීමෙන් පසුව එම ධුර දරන්නා, නැවත තෝරා පත්කර ගැනීම සඳහා සුදුස්සකු වන්නේ ය.

(ආ) යම් ධුර දරන්නකු මියයාම, ඉල්ලා අස්වීම, නොහැකියාවකට පත්වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම නිසා පුරප්පාඩුවක් ඇතිවන අවස්ථාවක දී, විධායක සභාව විසින් සංස්ථාවේ රීති සැලකිල්ලට ගෙන එම පුරප්පාඩුව පිරවීම සඳහා යම් තැනැත්තකු තෝරා පත්කර ගත යුතු හෝ පත්කර ගත යුතු ය.

(ඇ) (ආ) ඡේදය යටතේ තෝරා පත්කර ගනු ලබන හෝ පත්කර ගනු ලබන තැනැත්තා, ඔහු අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

(ඈ) විධායක සභාවේ සභාපතිවරයා ලෙස තෝරා පත්කර ගනු ලබන තැනැත්තා එම ධුරයේ උපරිම වසර දෙළහක කාල සීමාවකට යටත්ව දෙවරකට වඩා වැඩි වාර ගණනකට තෝරා පත්කර ගන්නට නුසුදුසුසකු වන්නේ ය.

සංස්ථාපිත මණ්ඩලයේ බලතල

7. (1) සංස්ථාපිත මණ්ඩලයේ උත්තරීතර මණ්ඩලය වන්නේ මහා සභාවයි. එය සංස්ථාවේ සියලුම සාමාජිකයන්ගෙන් සමන්විත වේ.

(2) මහා සභාවේ කාර්යයන් වන්නේ -

(අ) සංස්ථාපිත මණ්ඩලයේ විධායක සභාව සංස්ථාවේ රීතිවලට අනුකූලව තෝරාපත් කර ගැනීම;

(ආ) සංස්ථාපිත මණ්ඩලයේ මූලස්ථානය මාරුකිරීමට අදාළ තීරණ ගැනීම;

(ඇ) සංස්ථාපිත මණ්ඩල විසුරුවා හැරීමට අදාළ තීරණ ගැනීම;

(ඈ) සංස්ථාපිත මණ්ඩලයේ රීති සම්මත කිරීම සහ සංශෝධනය කිරීම;

(ඉ) මහා සභාවේ කාර්යයන් පිළිබඳව පටිපාටිය කටයුතු රීති මගින් සකස් කිරීම;

(ඊ) සංස්ථාපිත මණ්ඩලයේ විධායක කටයුතු මෙහෙයවීම සඳහා විධායක සභාව නම් ආයතනයක් ස්ථාපනය කිරීම;

(උ) විධායක සභාව සඳහා සාමාජිකයන් තෝරාපත් කරගැනීම මහා සභාවේ දී සාමාජික ඡන්දයෙන් සිදුකළ යුතු ය; සහ

(ඌ) විධායක සභාවේ සංයුතිය, විධායක සභාව යටතේ පවතින ආයතන, ඒවායේ කාර්යයන් සහ එකී ආයතනවල සාමාජිකයන්ගේ සුදුසුකම් සහ පත්වීමේ ක්‍රමවේදය පිළිබඳව රීති මගින් විධිවිධාන සැලසිය යුත්තේ ය.

**සංස්ථාපිත මණ්ඩලයේ විධායක සභාව**

**8.** (1) සංස්ථාපිත මණ්ඩලයේ විධායක කටයුතු මෙහෙයවීම සඳහා විධායක සභාව නම් ආතනයක් ස්ථාපනය කළ යුතු ය.

(2) විධායක සභාවේ කාර්යයන් වන්නේ -

(අ) සංස්ථාපිත මණ්ඩල වෙනුවෙන් දේශීය සහ විදේශීය ගිවිසුම්වලට එළඹීම පිළිබඳ තීරණ ගැනීම;

(ආ) මහා සභාව විසින් පවරනු ලබන කටයුතු ඉටු කිරීම;

(ඇ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා වන ක්‍රියාකාරකම් සඳහා අදළ සාමාජිකයන්ට අනුමැතිය ලබා දීම සහ මෙහෙයවීම; සහ

(ඈ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා අදළ වන වෙනත් මෙහෙයවීම් ඉටුකිරීම.

(3) විධායක සභාව සඳහා සාමාජිකයන් තෝරාපත් කර ගැනීම මහා සාභාවක දී සාමාජික ඡන්දයෙන් සිදුකළ යුතු ය.

(4) විධායක සභාවේ සංයුතිය, විධායක සභාව යටතේ පවතින ආයතන, ඒවායේ කාර්යයන් සහ එකී ආයතනවල සාමාජිකයන්ගේ සුදුසුකම් සහ පත්වීමේ ක්‍රමවේදය පිළිබඳව රීති මගින් විධිවිධාන සැලසිය යුත්තේ ය.

**සංස්ථාපිත මණ්ඩලයේ සෙනෙට් සභාව**

**9.** (1) ධර්ම විනය කරුණු සම්බන්ධයෙන් සහ විධායක සභාවේ තීරණ සම්බන්ධයෙන් සංවාද කිරීමට සහ එම කරුණු සම්බන්ධයෙන් මහා සභාවට සහ විධායක සභාවට අදහස්, යෝජනා සහ නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා සංස්ථාපිත මණ්ඩලයේ ගරු ස්වාමීන් වහන්සේලාගෙන් සහ ශිෂ්‍ය ස්වාමීන් වහන්සේලාගෙන් සමන්විත වූ සෙනෙට් සභාව නමැති ආයතනයක් ස්ථාපනය කළ යුතු ය.

(2) සෙනෙට් සභාවේ කටයුතු සහ විධිමත්භාවයන් පිළිබඳ පටිපාටි සෙනෙට් සභාව විසින් සකස් කළ යුත්තේ ය.

(3) සෙනෙට් සභාවේ බලතල පිළිබඳව මහා සභාව විසින් රීති සකස් කල යුත්තේ ය. එහි රීති මහා සභාව විසින් සම්මත කළ පසු බලාත්මක වන්නේ ය; සහ

(4) සෙනෙට් සභාව මහා සභාවට පමණක් වගකිව යුතු වන්නේ ය.

**සංස්ථාපිත මණ්ඩලයේ විනය කමිටුව**

10. (1) සංස්ථාපිත මණ්ඩලයේ සියළු සාමාජිකයන්ගේ සහ පුහුණු අභ්‍යාසලාභීන්ගේ සියළු විනය කටයුතු සිදුකිරීම සඳහා විනය කමිටුවක් ස්ථාපනය කළ යුතු ය.

(2) විනය කමිටුව මහා සභාවට පමණක් වගකිව යුත්තේ ය.

(3) විනය කමිටුවවට අදාළ රීති විනය කමිටුව විසින් සකස් කළ යුතු අතර, එකී රීති මහා සභාව විසින් සම්මත කළ පසු බලාත්මක විය යුත්තේ ය.

(4) විධායක සභාව විසින් ගන්නා ලද තීන්දු තීරණ සම්බන්ධයෙන් සංස්ථාවේ සාමාජිකයකු විසින් හෝ සෙනෙට් සභාව විසින් විනය කමිටුවට පැමිණිලි ඉදිරිපත් කළ පසු විනය කමිටුව විසින් ඒ පිළිබඳව ධර්ම විනායානුකූලව සාධාරණව විමර්ශනය කිරීමෙන් අනතුරුව විධායක සභාවේ එම තීන්දු තීරණ ධර්ම විනයට, මෙම පනතට, සංස්ථාවේ ව්‍යවස්ථාවට හෝ වෙනත් යම් ලිඛිත නීතියකට අනනුකූලව යයි තීරණය වුවහොත් විධායක සභාවේ එම තීන්දු තීරණ ක්‍රියාත්මක කිරීම වැළැක්වීමට විනය කමිටුවට බලතල ඇත්තේ ය.

(5) විනය කමිටුව සංස්තාපිත මණ්ඩලයේ සාමාජිකයන්ගේ පුහුණු සහ අභ්‍යාසලාභීන්ගේ විනය කටයුතු සම්බන්ධයෙන් ද විධායක සභාවේ තීරණ සම්බන්ධයෙන් ද ධර්ම විනයානුකූලව සාධාරණව විනිශ්චය දීම කළ යුත්තේ ථේරවාද සම්ප්‍රදය තුළ පිළිගත් පුරාණ සඞ්ගායනා හයෙන් සම්මත කරන ලදුව අද වන විට බුරුමය, තායිලන්තය, ලාඕසය, කාම්බෝජය සහ ශ්‍රී ලංකාව යන රටවල සහ යුරෝපා රටවල මනාකොට සංරක්ෂණය වී පවතින ථේරවාද ත්‍රිපිටකය, අර්ථකථා සහ ටීකා සහ ථේරවාදයට අනුව ථේරවාදයට පටහැනි නොවන ලෙස රචිත සංග්‍රහ ග්‍රන්ථවල ඇතුළත් ධර්ම විනය කරුනු සහ සම්භාවනීය උගතුන්ගේ ථේරවාදයට පටහැනි නොවන ධර්ම විනය සම්බන්ධ අදහස් මත පිහිටාගෙන ය.

**සංස්ථාපිත මණ්ඩලයේ බලතල**

11. මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ හෝ ඒ අතරින් යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය හෝ නංවාලීම සඳහා පහත සඳහන් අවශ්‍ය හෝ අපේක්ෂිත සියලු ක්‍රියා හා කාරණා කිරීමේ, ක්‍රියාත්මක කිරීමේ සහ ඉටුකිරීමේ බලය සංස්ථාපිත මණ්ඩලයට තිබිය යුතු ය:—

(අ) සංස්ථාපිත මණ්ඩලයේ කාර්ය සඳහා අවශ්‍ය වන්නා වූ ඉඩම් හෝ ගොඩනැගිලි මිල දී ගැනීම, අත්කර ගැනීම, කුලියට ගැනීම, ඉදිකිරීම හෝ අලුත්වැඩියා කිරීම සහ

අන්‍යාකාරයකින් ලබාගැනීමට සහ සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව සුදුසු යැයි සැළකෙන අයුරින් ඒවා සම්බන්ධයෙන් ක්‍රියා කිරීම හෝ ඒවා බැහැර කිරීම;

(ආ) ඇප සහිතව හෝ රහිතව මුදල් ණයට ගැනීම හෝ රැස්කිරීම සහ මුදල් හෝ ද්‍රව්‍යවලින් ප්‍රදන, ත්‍යාග හෝ පරිත්‍යාග ලබාගැනීම:

එසේ වුව ද, සංස්ථාව වෙත ලබාදනු ලබන විදේශීය ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග සම්බන්ධයෙන් කමිටුව විසින් මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අනුමතය ලබාගත යුතු ය;

(ඇ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගනුදෙනු කළ හැකි සාධන පත්‍ර සකස් කිරීමට, ලිවීමට, භාර ගැනීමට, වට්ටම් දීමට, පිටසන් කිරීමට, ගනුදෙනු කිරීමට, මිලට ගැනීමට, විකිණීමට සහ නිකුත් කිරීමට සහ යම් බැංකුවක ගිණුම් විවෘත කිරීමට, ක්‍රියාත්මක කිරීමට, පවත්වාගෙන යාමට සහ වැසීමට;

(ඈ) සංස්ථාපිත මණ්ඩලයේ කාර්යයන් සඳහා වහාම අවශ්‍ය නොවන යම් අරමුදල් කමිටුව විසින් තීරණය කරනු ලබන ආකාරයකින් ආයෝජනය කිරීමට;

(ඉ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව ඉඩකඩම් හෝ පෞද්ගලික දේපළකට බලපාන්නා වූ යම් නීතිමය භාරයක් හා කොන්දේසි භාර ගැනීමට, පිළිගැනීමට, ක්‍රියාත්මක කිරීමට, ඉටු කිරීමට සහ පරිපාලනය කිරීමට;

(ඊ) සංස්ථාපිත මණ්ඩලයේ නිලධරයන් සහ සේවකයන් පත්කිරීම, සේවයෙහි නියුක්ත කිරීම, සේවයෙන් පහකිරීම හෝ සේවය අවසන් කිරීම සහ ඔවුන් විෂයෙහි විනය පාලනය පවත්වාගෙන යාම සහ සංස්ථාව විසින් තීරණය කරන ලද වැටුප්, දීමනා සහ පාරිතෝෂික ගෙවීම; සහ

(උ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ නිසි ලෙස සහ ඵලදායීව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය හෝ සුදුසු වෙනත් සියලු දේ සිදු කිරීම.

සංස්ථාපිත මණ්ඩලයේ රීති

**12.** (1) සංස්ථාපිත මණ්ඩලය විසින්, සාමාජිකයන්ගේ යම් මහාසභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, මේ පනතට හෝ වෙනත් යම් ලිඛිත නීතියකට අනනුකූල නොවන රීති, පහත දැක්වෙන සියලු කාරණා හෝ ඉන් කිසිවක් සඳහා කලින් කළ සෑදීම නීත්‍යනුකූල විය යුතු යඃ-

(අ) සාමාජිකයන් වර්ග කිරීම, සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඉවත් කිරීම, නෙරපීම හෝ ඉල්ලා අස්වීම සහ සාමාජිකයන් විසින් ගෙවිය යුතු ගාස්තු;

(ආ) සංස්ථාපිත මණ්ඩලයේ එහි විධායක සභාවේ, සෙනට් සභාවේ සහ විනය කමිටුවේ ධුර දරන්නන්ගේ සංඛ්‍යාව, සාමාජිකයකු වීමට අවශ්‍ය සුදුසුකම් සහ නුසුදුසුකම්;

(ඇ) සංස්ථාපිත මණ්ඩලයේ එහි විධායක සභාවේ, සෙනට් සභාවේ සහ විනය කමිටුවේ ධුර දරන්නන් තෝරා පත්කර ගැනීම, ධුරය හිස් කිරීම හෝ ධුරයෙන් ඉවත් කිරීම සහ ධුර දරන්නන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය;

(ඈ) සංස්ථාපිත මණ්ඩලයේ විවිධ නිලධරයන්ගේ, අනුයෝජිතයන්ගේ හා සේවකයන්ගේ පත්වීම, බලතල කාර්ය හා කර්තව්‍ය සහ කොන්දේසි සහ නියමයන්;

(ඉ) විධායක සභාවේ හේ එහි යම් අනුකමිටුවක රැස්වීම් කැඳවීමේ දී හා පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්යය පටිපාටිය, රැස්වීම් පිළිබඳ නිවේදන හා න්‍යාය පත්‍ර, ගණපූරණය සහ ඒ රැස්වීම්වල කටයුතු කරගෙන යාම;

(ඊ) සංස්ථාපිත මණ්ඩලයේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම;

(උ) පොදුවේ සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන්පත් කරගැනීම සහ සංස්ථාව විසුරුවා හැරීම; සහ

(ඌ) සංස්ථාපිත මණ්ඩලයේ ව්‍යවස්ථාව සම්මත කිරීම සහ එයට සංශෝධන ගෙන ඒම.

(2) සංස්ථාපිත මණ්ඩලය විසින් සාදන ලද යම් රීතියක් මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සාදන ලද රීතියක් මෙන්ම එවැනිම රැස්වීමක දී එවැනිම ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන් සෑම කල්හිම සංස්ථාවේ රීති වලට යටත් විය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ සාදනු ලැබූ සංස්ථාවේ රීති රජයේ ගැසට් පත්‍රයේ පළ කළ යුතු ය.

(5) එසේ වුවද, සංස්ථාවේ පළමු විධායක සභාව, මහ සභාව විසින් ඡන්දයෙන් තෝරා පත්කර ගත් දින සිට මුල් වසර හය ඇතුළත රීති සම්පාදනය කිරීම "විධායක සභාවට" කළ හැකි ය.

**13.** සාමාජිකයන්ගේ නම්, ලිපින සහ වෙනත් අත්‍යවශ්‍ය තොරතුරු ඇතුළත් කරන ලද සාමාජිකයන්ගේ ලේඛනයක් මණ්ඩලය විසින් පවත්වාගෙන යා යුතු ය. සාමාජිකයන්ගේ සාමාජික ලේඛනය

**14.** (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු ය. සංස්ථාපිත මණ්ඩලයේ අරමුදල

(2) සංස්ථාපිත මණ්ඩලය සඳහා සහ වෙනුවෙන් ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, ග්‍රාහක මුදල්, දයක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන වශයෙන් ලැබෙන සියලුම මුදල්, කමිටුව විසින් අනුමත කරන ලද එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනක සංස්ථාපිත මණ්ඩලයේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්යය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී හා ඉටු කිරීමේ දී සංස්ථාව විසින් දරනු ලබන වියදම් පියවීමට අවශ්‍ය සියලු මුදල් සංස්ථාපිත මණ්ඩලයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

ගිණුම් සහ විගණනය

**15.** (1) සංස්ථාපිත මණ්ඩලයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාපිත මණ්ඩලය විසින් එහි ආදායම සහ වියදම, හා වත්කම් බැරකම් සහ සංස්ථාපිත මණ්ඩලයේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳ නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාපිත මණ්ඩලයේ ගිණුම්, විගණකාධිපතිවරයා විසින් හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාව ප්‍රකාර විගණකාධිපතිවරයා විසින් පත් කරනු ලබන සුදුසුකම් ලත් විගණකවරයෙකු විසින් වාර්ෂිකව විගණනය කරනු ලැබිය යුතු ය.

මේ වගන්තියේ ''සුදුසුකම් ලත් විගණකවරයා'' යන්නෙන් -

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක්; හෝ

(ආ) ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වන්නා වූ ද, ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද, එවැනි වරලත් ගණකාධිකාරී ආයතනයක්,

අදහස් වේ.

වාර්ෂික වාර්තාව

**16.** (1) කමිටුව විසින් සංස්ථාවේ කටයුතු පිළිබඳ වාර්තාවක් සෑම මුදල් වර්ෂයක් සඳහා සකස් කරනු ලැබිය යුතු අතර, එම වාර්තාව විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශය සමග වාර්තාව අදාළ වසරට පසුව එන වර්ෂයේ සය මාසයක් ඉකුත්වීමට පෙර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය.

(2) මුදල් වර්ෂය තුළ දී සංස්ථාපිත මණ්ඩලය වෙත දේශීය හා විදේශීය වශයෙන් ලැබුණු මුදල් පිළිබඳ වෙනම ගිණුමක් (1) වන උපවගන්තියේ සඳහන් වාර්තාව සමග යැවිය යුතු ය.

ආයතනය විසින් ගෙවිය යුතු සහ පදනමට අයවිය යුතු ණය

**17.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවති පදනම විසින් ගෙවිය යුතු සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාපිත මණ්ඩලය විසින් ගෙවනු ලැබිය යුතු අතර, එදිනට ආයතනයට අයවිය යුතු සියලු ණය සහ ආයතනයට ගෙවිය යුතු සාමාජික මුදල් සහ දයක මුදල් මේ පනතේ කාර්යය සඳහා සංස්ථාපිත මණ්ඩලය වෙත ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාපිත මණ්ඩලය විසින් චංචල හා නිශ්චල දේපළ දැරිය හැකි බව

**18.** යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නීයාදනයක් හෝ වෙනත් යම් ආකාරයකින් සංස්ථාව සතුවන යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට මේ පනතේ විධිවිධානවලට යටත්ව නීතියෙන් සංස්ථාපිත මණ්ඩලයට හැකියාව සහ බලය ඇති අතර, ඒ දේපළ විකිණීමේ, උකස් කිරීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් ආකාරයකින් නීයාදනය කිරීමේ පූර්ණ බලය ඇතිව, 7 වන වගන්තිය යටතේ සාදන ලද සංස්ථාපිත මණ්ඩලයේ රීතිවලට යටත්ව, මේ පනතේ කාර්යය සඳහා සංස්ථාපිත මණ්ඩලය විසින් ඒ සියලු දේපළ දැරිය යුතු ය.

මුදල් සහ දේපළ අදාළ කර ගැනීම

**19.** කවර ආකාරයකින් හෝ ලබා ගන්නා සංස්ථාපිත මණ්ඩලයේ මුදල් හා දේපළ සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ඉටුකර ගැනීම කෙරෙහි පමණක් අදාළ කරගත යුතු අතර, එයින් කවර හෝ කොටසක් සංස්ථාවේ සාමාජිකයන්ට ලාභාංශ මුදල්, ප්‍රසාද දීමනා හෝ ලාභ වශයෙන් සෘජුව හෝ අන්‍යාකාරයෙන් නොගෙවිය යුතු හෝ නොපැවරිය යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ මුද්‍රාව

**20.** (1) විධායක සභාවේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු අතර, ඔවුන් දෙදෙනා තමන් පැමිණ සිටින බවට ලකුණක්

වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමකට පරිබාහිරව විය යුතු ය.

(2) සංස්ථාපිත මණ්ඩලයේ මුද්‍රාව, කමිටුව විසින් තීරණය කරනු ලැබිය හැකි මණ්ඩලයේ යම් ධුර දරන නිලධරයකු භාරයේ තිබිය යුතු ය.

*විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපළ*

**21.** (1) සංස්ථාපිත මණ්ඩලය විසුරුවා හැරීමේ දී, එහි සියලු ණය සහ බැරකම් ගෙවා සමථයට පත්කිරීමෙන් පසු කවර හෝ යම් දේපළක් ඉතිරි වුවහොත්, ඒ දේපළ සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන් අතර බෙදා දෙනු නොලැබිය යුතු අතර, සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදයමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදාදීම තහනම් කර ඇත්තා වූ ද, වෙනත් ආයතනයකට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය.

(2) (1) වැනි උපවගන්තියේ කාර්ය සඳහා උචිත ආයතනය, සංස්ථාපිත මණ්ඩලය විසුරුවා හැරීමට පෙරාතුවම සංස්ථාවේ සාමාජිකයන් විසින් සභාවේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කළ යුතු ය.

*ජනරජයේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම*

**22.** ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

*අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව*

**23.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.